සියළුම හිමිකම් ඇවිරිණි]
*All Rights Reserved ]*

# පාසල් වලට සිසුන් තොරා ගැනීමට සහ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සඳහා පැවැත්වෙන විභාගය

## II පත්‍රය

## නැණ ලොවට පා නගන හපනුන්ට මඟ කියන

# "අදිති"

පැය 01 යි මිනි 15

පෙරහුරු ප්‍රශ්න පත්‍රය - 03

විභාග අංකය ...............................

**විභාගයට පෙනී සිටින ඔබ සඳහා උපදෙස්**

- ඔබේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
- තුන්වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේද ඔබේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 60 ක් ඇත ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම ලියන්න.
- පිළිතුරු 3 ක් දී ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න පිළිතුරු ලියන්නට ඇති ප්‍රශ්නවල පිළිතුරු තිත් ඉර මත ලියන්න.
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |
| 8 | |
| එකතුව | |
| අවසාන ලකුණ | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| **පළමු පරීක්ෂක**<br>ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීම් කළ බව සහතික කරමි. | <br>V/I/S |
| **දෙවන පරීක්ෂක**<br>පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි. | <br>V/I/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක**<br>ඇගයීම් කර ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි. | <br>V/I/S/EMF |
| **ප්‍රධාන පරීක්ෂක**<br>අධීක්ෂණය කළෙමි.<br>අවසාන ලකුණ නිවැරදිය. | <br>V/I/S/CH |

01. **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

වෙදකමට ප්‍රසිද්ධ වෙද මහත්තුරු මින්නේරි ගම්වල විසූහ. සර්වාංග වෙදකමට සේම, සර්ප වෙදකමට ද බොහෝ ප්‍රසිද්ධ වූවෝ ඒ ගම්වල විසූහ. ලෙඩකු වූ විට රැයේ පානේ බව නොසලකා ලෙඩා වෙසෙන ගමට ගොස් වෙදකම් කිරීමට තරම් මේ දේශීය වෛද්‍යවරු කාරුණික වූහ. වෙදකම කෙරුණේ හුදෙක් ම පින් සලකාගෙනය. වෙදකම සඳහා සතයකුදු අය නොකිරීමට වෙද මහත්තුරු පුරුදු ව සිටියෝ ය.

(1) මින්නේරි ගම්වල විසුවේ කවුරුන් ද?

______________________________

(2) ඔවුහු ප්‍රසිද්ධ වූයේ කුමන වෙදකම් සඳහා ද?

______________________________

(3) මෙම වෙද මහත්වරු පුරුදුව සිටියේ කුමක් සඳහා ද? ______________________________

(4) ''දේශීය වෛද්‍යවරු කාරුණික වූහ.'' මෙම වාක්‍ය වර්තමාන කාලයට හරවා ලියන්න.

______________________________

(5) පහත දී ඇති වචනවල ඉරි ඇඳි අකුරට යෙදී ඇති පිල්ලම නම් කරන්න.

(i) කා<u>රු</u>ණික - ______________________________

(ii) <u>වෛ</u>ද්‍යවරු - ______________________________

(ලකුණු 06)

02. පහත සඳහන් වාක්‍ය අතරින් නිවැරදි වාක්‍ය ඉදිරියෙන් (√) ලකුණ ද වැරදි වාක්‍ය ඉදිරියෙන් (×) ලකුණ ද යොදන්න.

(1) අයියට මම පැන්සලක් දුන්නේ ය. ( )

(2) ලේන්නු ඉදුණු අඹ කෑවෝය. ( )

(3) අලියා වනයට ඇතුළු වූහ. ( )

(4) නැන්දලා ඇඳුම් මැසුවාය. ( )

(ලකුණු 04)

03. පහත ප්‍රස්තා පිරුළේ හිස්තැන් පුරවන්න.

(1) ආඬි හත්දෙනාගේ ______________________________ වගේ.

(2) ඉබ්බාගෙන් ______________________________ඉල්ලනවා වගේ.

(ලකුණු 02)

04. නිවැරදිව ගලපා වගන්තියක් සාදන්න.

පිළිබඳ/ යන්න/ ''සුන්දර රැය''/ දිනක්/ ලිවුවේය./ කවි/ ඔහු/ පන්තියක්

______________________________

______________________________

(ලකුණු 01)

05. වැරදි අක්ෂර වින්‍යාසය යොදා ඇති වචන තෝරා එම වචන පමණක් නිවැරදි කර ලියන්න.

පාසලේ පැවති තාක්ෂණික ප්‍රදර්ශණය අවසානයේ වටිනා පර්ඝණකයක් පාසලට ලැබුණි.

(1) ______________________________ (2) ______________________________ (ලකුණු 02)

06. හිස් තැනට සුදුසු අතීතකාල ක්‍රියාපදය වරහන් තුළින් තෝරා යටින් ඉරක් අඳින්න.

(1) ගෙවිලිය ඇඹුල ගෙන කුඹුරට ______________________________(ගියා ය./ගියේ ය)

(2) මුවා සහ මුවදෙන දිය බීමට වැවට ______________________________ (බැස්සහ/ බැස්සේ ය)

(3) අයියා මට පොතක් ______________________________ (දුන්නාය/ දුන්නේය)

(4) මම උදෙන්ම පාසලට ______________________________ (ගියෙමි/ ගියෙමු)

(ලකුණු 04)

07. හිස්තැනට සුදුසු ඉඟිවැකිය වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.

(1) දැඩි සතුටකට පත් වීම. ____________________

(2) ඉටුනොවන සිහින මැවීම. ____________________

(එක හුස්මට / ඉහේ මලක් පිපුණා වගෙයි / අහසේ මාලිගා) (ලකුණු 02)

08. පහත ප්‍රස්ථාව පිරුළු වලට ගැළපෙන අදහස වරහන් තුළින් තෝරා ලියන්න.

(1) කළුවා මාරපන් ගියා වගෙයි. ____________________

(2) කැකිල්ලේ රජ්ජුරුවන්ගේ නඩු තීන්දුව වගේ. ____________________

( තීරණ ගැනීමේ දී බුද්ධිමත් ලෙස කටයුතු නොකර නුසුදුසු තීරණ ගැනීම./ එක තීරණයක නොසිටීම/ විමසීමකින් තොරව යමක් කිරීම) (ලකුණු 02)

09. පහත වගන්ති සඳහා නිවැදිව විරාම ලකුණු යොදන්න.

(1) හැබෑට ඒ මොකක් ද ගමරාල

(2) වුණ දේට මොනව කරන්න ද මම හිතලයැ තනියම කැවේ (ලකුණු 02)

10. පහත දෙමළ වගන්තියේ සිංහල තේරුම ලියන්න.

(1) නාන් වෙළියේ පෝහලාමා.

____________________

(2) උංගලුක්කු තණ්ණීර් වේන්ඩුමා

____________________

(ලකුණු 02)

11. පහත වචන සඳහා ගැළපෙන දෙමළ වචන ලියන්න.

(1) කහපාට - ____________________

(2) නවතින්න - ____________________

(3) ක්‍රීඩා පිටිය - ____________________

(ලකුණු 03)

12. නිවැරදිව ගළපා වගන්ති සාදන්න.

(1) am / reading / I / book / a

____________________

(2) I / go / Canteen? / May / The/ to

____________________

(ලකුණු 02)

13. එක් එක් රූපයට ගැළපෙන ඉංග්‍රීසි වචනයෙහි අඩු අකුරු සම්පූර්ණ කරන්න.



| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| W | a | __ | e | __ | __ | e | l | __ | n |



| | | |
|---|---|---|
| S | __ | __ |

(ලකුණු 02)

14. එක් එක් ඉංග්‍රීසි වචනයෙහි සිංහල අර්ථය ලියන්න.

(1) Festival - ____________________

(2) Doughter - ____________________

(ලකුණු 02)

15. පාසලේ පැවති ශ්‍රමදානය සඳහා නිපුනිගේ පියා සමග නිපුනිද ඒ සදහා සහභාගී විය. එහිදී ඇය වැඩිහිටියන් සමග ශ්‍රමදාන කටයුතු සඳහා ද සහාය දැක් වූ අතර" එහි නිපුනි ඔබ යැයි සිතා, එහිදී ඔබ කළ දේ ඇතුළත් උක්ත ආඛ්‍යාත පද සම්බන්ධ හා අක්ෂර වින්‍යාසය නිවැරදිව වචන 5කට නොඅඩු වගන්ති 3ක් ලියන්න.

(1) ______________________________

______________________________

(2) ______________________________

______________________________

(3) ______________________________

______________________________

(ලකුණු 06)

16. ඉලක්කමෙන් ලියන්න.
හැත්තෑ හතර දහස් විසි පහ - ______________________________

17. රූපයේ ඇති මල් ගණනට 8ක් අඩු ගණන රෝම ඉලක්කමෙන් ලියන්න.



______________________________

18. පහත රූපයේ $\frac{2}{4}$ ක් පාට කරන්න.



19. රමේෂ් ප.ව. 2.40ට පුස්තකාලයට ගොස් පැය 2 මිනිත්තු 45කට පසු පුස්තකාලයෙන් පිටත් විය. ඔහු පුස්තකාලයෙන් පිටත් වූ වේලාව සාමාන්‍ය ඔරලෝසු වේලාවෙන් දක්වන්න. ______________________________

20. පොත් 836 ක් එක් අයෙකුට 4 ක් බැගින් කී දෙනෙකුට බෙදා දිය හැකි ද? ______________________________

21. 10 kg 750g ක් බර තේ කුඩු පාර්සලයක් 250g ක් වන කුඩා පාර්සල කීයක් ඇසිරිය හැකි ද?

______________________________

22. එක් භාජනයකට ඇති දියර ප්‍රමාණය 7l 750 ml කි. අනෙක් භාජනයේ ඇති දියර ප්‍රමාණය 13l 975 ml කි. භාජන දෙකෙහි ඇති දියර ප්‍රමාණයේ වෙනස කොපමණ ද? ______________________________

23. සීනි 500g ක මිල රු. 140.00 කි. සීනි 1 kg 750 g ක මිල කොපමණ ද? ______________________________

24. 50km ක් දුර ගමනක් යන මගියෙකු එම දුරින් 32 km 800mක් දුර දුම්රියෙන් ගමන් කර ඉතිරිය බසයෙන් ගමන් කළේ ය. ඔහු බසයෙන් ගමන් කළ දුර කොපමණ ද? ______________________________

25. පහත දැක්වෙන්නේ ප්‍රාථමික පාසලක එක් දිනක දී නොපැමිණි සිසුන් ප්‍රමාණය දැක්වෙන වගුවකි. (එක් ශ්‍රේණියක සිසුන් ගණන 40 කි.)

| පන්තිය | සිසුන් ගණන |
|---|---|
| 1 ශ්‍රේණිය | 09 |
| 2 ශ්‍රේණිය | 06 |
| 3 ශ්‍රේණිය | 06 |
| 4 ශ්‍රේණිය | 08 |
| 5 ශ්‍රේණිය | 05 |




(1) වගුව ඇසුරින් ප්‍රස්තාරය සම්පූර්ණ කරන්න.
(2) එදින පාසලට පැමිණි මුළු සිසුන් ගණන කීය ද?

26. පහත සම්බන්ධයට අනුව හිස් ගණක රාමුවලට අදාල අගය ගණක රාමුව මත නිරූපණය කරන්න.




27. සංඛ්‍යා දෙකක් අඩු කිරීමෙන් ලැබෙන පිළිතුර පහත දැක්වේ. එහි සංඛ්‍යාවක එකස්ථානය හා සියස්ථානයේ ඉලක්කම් මැකීගොස් ඇත. ඒ සඳහා x ලකුණ යොදා ඇති එම ඉලක්කම් දෙක පිළිවෙලින් ලියන්න.

8 x 5 x - 2327 = 6427

එකස්ථානය - ____________________ සියස්ථානය - ____________________

28. පන්තියක සිටින සිසුන් 48න් $\frac{1}{3}$ ක් පිරිමි ළමුන් වේ. එහි සිටින ගැහැනු ළමුන් ගණන කීය ද?

29. පහත ඇත්තේ සමපාද (පාද තුනම සමාන) ත්‍රිකෝණයකි. එහි සමමිතික රේඛා සියල්ල නිවැරදිව ඇඳ දක්වන්න.



30. ළමයෙක් A නම් ස්ථානයෙන් පටන්ගෙන 40 m ක් උතුරු දෙසට ගමන්කර 30mක් බටහිර දෙසට ගමන්කර නැවත 50mක් දකුණු දිශාවට ගමන් ගත්තේ ය. එම ගමන් විස්තරය පහත දී ඇති කොටුජාලය තුළ ඇඳ දක්වන්න. (සමචතුරස්‍ර කොටුවක පැත්තක දිග 10m ක් සේ සලකන්න.) (2×15 = 30)



✸ නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

31. සූර්ය නමස්කාර ක්‍රියාකාරකමේ පළමු අවස්ථාව හා අවසන් අවස්ථාව නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.


(1)


(2)


(3)

32. කෑම කාමරයේ දී භාවිත වන උපකරණ දෙකකි.
(1) මේසය හා පුටු සෙටිය (2) හැන්ද හා පිඟාන (3) ඔරලෝසුව හා දුරකථනය

33. තුත්තිරි, ඇපල, කරල් සැබෝ වැනි ශාක බෝවන්නේ,
(1) ජලය මගින් (2) සතුන් මගින් (3) සුළඟ මගින්

34. පොදු වාහනයක ගමන් කිරීමේ දී අනුගමනය කළ යුතු ආචාර ධර්මයකි.
(1) දුම් බීම
(2) පා පුවරුවේ ගමන් කිරීම
(3) ගමන් ප්‍රවේශ පත්‍රයක් මිල දී ගැනීම.

35. 
මෙම උපකරණය භාවිතා කරනු ලබන්නේ,
(1) ලීයක් සිදුරු කර ගැනීමට
(2) වතුර උණු කර ගැනීමට
(3) කේක් සාදා ගැනීමට

36. 
රූපයේ දැක්වෙන්නේ,
(1) ගුවන් විදුලියේ කොටසකි
(2) දුරකථනයේ කොටසකි
(3) පරිගණකයේ කොටසකි

37. ශ්‍රී ලංකාවේ පැරණි සිතුවම් සහිත විශාල ම ලෙන් විහාරයකි.
(1) කැලණිය රජ මහා විහාරය (2) දඹුලු රජ මහා විහාරය (3) කිරි වෙහෙර

38. 
රූපයේ දැක්වෙන අපේ රට විදේශීය ආක්‍රමණිකයින්ගෙන් බේරා ගැනීමට කැප වී ක්‍රියා කළ පුද්ගලයා වන්නේ,
(1) ගොංගාලේ ගොඩබණ්ඩා
(2) වීර පුරන් අප්පු
(3) මොනරවිල කැප්පෙටිපොළ දිසාව

39. 
රූපයේ දැක්වෙන්නේ,
(1) වරා
(2) හොර
(3) කොට්ට පුලුන්

40. ජල රෝදයක් නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය දේවල් පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
   (1) කෙසෙල් බඩ රවුමක්, ඒකාකාරී දණ්ඩක්, යෝගට් හැඳි, නූල් කුඩා භාරයක්, ආධාරක දෙකක්
   (2) රිජිෆෝම් රවුමක්, යෝගට් හැඳි, ආධාරක දෙකක්, ස්පෝක් කම්බියක්
   (3) ලී පතුරක්, යකඩ ඇණ, කෙසෙල් බඩයක්, වියළි කෝෂ

41. නව තාක්ෂණය යටතේ මුළුතැන්ගෙයට එක් වී ඇති උපකරණයකි.


(1)


(2)


(3)

42. ප්‍රචාරක ආයතනවල අරමුණ වන්නේ,
   (1) පාරිභෝගිකයාට ගුණාත්මක භාණ්ඩ හා සේවා ලබා දීම.
   (2) මුදල් ඉපයීම.
   (3) පාරිභෝගිකයාගේ ආදායමට සරිලන භාණ්ඩ ලබා දීම.

43. බෝවන රෝගවලින් ආරක්ෂා වීමට අනුගමනය කළ යුතු නිවැරදි චර්යාවකි.
   (1) ව්‍යායාම් නොකිරීම
   (2) ක්ෂණික ආහාර නිතර ගැනීම
   (3) එළවළු, පලතුරු, පලා වර්ග ආහාරයට වැඩිපුර එක් කර ගැනීම.

44. 

මෙම සංකේතය සහිත සියලුම විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික් උපකරණ,
   (1) පරිසරයට බැහැර කළ යුතුය.
   (2) පරිසරයට බැහැර නොකළ යුතු ය.
   (3) ප්‍රතිචක්‍රීකරණය කළ හැකිය.

45. 


මෙම විදුලි පන්දමේ ඇති බල්බය,
   (1) දැල් වේ.
   (2) නොදැල් වේ.
   (3) කිව නොහැකිය.

46. දේවානම්පියතිස්ස රජතුමා විසින් ඉදි කරන ලද වැවකි.
   (1) කලා වැව (2) තිසා වැව (3) බළලු වැව

47. මාලිමාවක් භාවිතයෙන්,
   (1) සුළඟේ වේගය සොයා ගත හැකිය.
   (2) උතුරු දිශාව සොයා ගත හැකිය.
   (3) වර්ෂය හා ප්‍රමාණය සොයා ගත හැකිය.

48. ඓතිහාසික වටිනාකමකින් යුත් ස්ථාන සංරක්ෂණයට අප විසින් කළ යුතු දෙයකි.
   (1) කුරුටු ගෑම
   (2) කසළ බැහැර කිරීම
   (3) උපදේශාත්මක පුවරුවල ඇති උපදෙස් හොඳින් පිළිපැදීම.

49. ළපටි අවදියේ දී රතු පැහැයක් ගන්නා ශාක පත්‍ර දෙවර්ගයකි.
   (1) බෝ හා දමින්නා (2) නුග හා කොහොඹ (3) නා හා මුරුංගා

50. මුස්ලිම් ජාතිකයින්ගේ ප්‍රධාන ආහාර වර්ග ඇතුළත් පිළිතුර තෝරන්න.
   (1) බුන්දි, රට ඉඳි, අලුවා, කිරිබත් සහ අග්ගලා
   (2) තෝසේ, සාම්බාරු හොදි, උළුඳු වඩේ, මුං කැවුම් සහ පරාටා
   (3) බුරියානි, පරාටා, වටලප්පන්, රට ඉඳි සහ ෆලූඩා

51. මිනිසුන් අපහසුතාවයට පත් වන අවස්ථාවකි.
   (1) පාරේ දකුණු පසින් අයින් ව ගමන් කිරීම.
   (2) බස් රථය තුළ අධික ශබ්දයෙන් කැසට් යන්ත්‍ර ක්‍රියාත්මක කිරීම.
   (3) පෝලිමේ සිට බැංකුවක ගනුදෙනු කිරීම

52. බෞද්ධයින්ගේ සැරසිල්ලකි,


(1)


(2)


(3)

53. 
මෙම සැරසිල්ල සඳහා යොදා ගෙන ඇත්තේ,
   (1) පන්
   (2) ගොක් කොළ
   (3) කඩදාසි

54. අහසේ සඳ නොපෙනෙන දවස හඳුන්වන්නේ,
   (1) අමාවක   (2) අව අටවක   (3) පුර අටවක

55. 
රූපයේ දැක්වෙන්නේ,
   (1) පලා පෙති මෝසතරයකි.
   (2) ලියවැල් මෝස්තරයකි.
   (3) රළපනාව මෝස්තරයකි.

56. සුළු උදරාබාධයක් සඳහා ලබා දෙන දෙයකි,
   (1) ඇස්ප්‍රින්   (2) බෙතඩීන්   (3) අසමෝදගම්

57. 
මෙම කැටයම දැකිය හැකි ස්ථානය වන්නේ,
   (1) ගල් විහාරය
   (2) දළදා මාලිගය
   (3) ඉසුරුමුණිය

58. ශ්‍රී ලංකාවේ බුදු දහම වැළඳගත් පළමු වන පාලකයා වූයේ කවුරුන් ද?
   (1) දුටුගැමුණු රජතුමා   (2) මහසෙන් රජතුමා   (3) දේවානම්පියතිස්ස රජතුමා

59. අතු කැබලි සිටුවා පැළ ලබා ගත හැකි බෝග වර්ග දෙකකි.
   (1) කංකුං, නිවිති   (2) මුකුණුවැන්න හා මිරිස්   (3) බතල හා වම්බටු

60. ඓතිහාසික වැදගත්කමකින් යුත් ස්ථානවලදී අප කළ යුතු දෙයකි.
   (1) රජයෙන් හා පුරා විද්‍යා දෙපාර්තමේන්තුව විසින් ලබා දෙන උපදෙස් පිළි පැදීම.
   (2) සංරක්ෂණ කටයුතු වලට පටහැනි ව කටයුතු කිරීම.
   (3) ප්ලාස්ටික් පොලිතීන් වැනි දේ පරිසරයට මුදා හැරීම.